# e - ඥාන පියස වැඩසටහන
## දියමන්ති ව්‍යාපෘතිය
## සමාන්‍ය පාඩම් - 4 පාඩම

| විෂය | ශ්‍රේණිය | වාරය | පාඩම/ඒකකය |
|---|---|---|---|
| චිත්‍ර කලාව | 10 | III | 7.2.4. දඹුලු ගලේ රූ වරුණා |

- ක්‍රි.ව. 1 වන සියවසේ දී පමණ වලගම්බා රජු විසින් (වට්ටගාමිණී අභය) මෙම ලෙන් විහාරය කරවා ඇති අතර දේව රාජ ලෙන මහා රාජ ලෙන මහා අලුත් විහාරය පශ්චිම විහාරය දෙවන අලුත් විහාරය ලෙස ප්‍රධාන වශයෙන් ලෙන් 05කින් සමන්විත ය.
- මහා රාජ ලෙන යනුවෙන් නම් කර ඇති ලෙනේ සැතපෙන බුද්ධ ප්‍රතිමා ඇතුළු බෝධිසත්ව හා රජවරුන්ගේ ප්‍රතිමා රැසක් දැකිය හැකි ය.
- දඹුලු විහාරයේ බිතු සිතුවම් ඇඳීමේ ගෞරවය හිමිවන්නේ නීලගම සිත්තර පරම්පරාවට ය.
- බෝධිසත්ව චරිත අවස්ථා (සූවිසි විවරණය ජාතක කතා) බුද්ධ චරිතයේ විවිධ අවස්ථා (මාරපරාජය රන්කාසි අතුරා ජේතවනය පුජා කිරීම) ඓතිහාසික සිදුවීම් (විජයාගමන මහින්දාගමනය ශ්‍රි මහා බෝධිය වැඩම කරවීම එළාර දුටුගැමුණු යුද්ධය) ලෙස සිතුවම් වර්ග කළ හැකි වේ.
- පාර්ශව දර්ශී රූප තීරු චිත්‍ර සංරචනවල අඛණ්ඩ කථන ක්‍රමය ද්විමාන ලක්ෂණ සහිත පැතලි වර්ණ භාවිතය වියළි බදාමය මත බිතු සිතුවම් ඇඳීම සියුම් රේඛාකරණය හා පර්යාලෝක රීතීන් නොසැලකීම සිතුවම් නිර්මාණවල සුවිශේෂ ලක්ෂණ වේ.

**<u>ඇගයීම</u>**

පහත දක්වා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න

1) දඹුලු ලෙන් විහාරය නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින්ද?

2) දඹුලු විහාරයේ බිතු සිතුවම් ඇඳීමේ ගෞරවය හිමිවන්නේ කා හටද?

3) දඹුලු විහාරයේ සිතුවම්වල වස්තු විෂයයන් හා විශිෂ්ට සිතුවම් නම් කරන්න

4) චිත්‍ර නිර්මාණ සඳහා පදනම් වූ ශෛලීය ලක්ෂණ හා ශිල්ප ක්‍රමය විස්තර කරන්න

5) දඹුලු විහාරයේ චිත්‍රවල කලා ලක්ෂණ අගයමින් විස්තර කරන්න


දඹුලු ලෙන් විහාර සංකීර්ණය


බුද්ධ ප්‍රතිමා හා දේව ප්‍රතිමාවක් (සුමන සමන් දෙවියන්)


බුද්ධත්වයෙන් පස්වන සතිය-මාර දූවරු පරාජය කිරීම


මාර පරාජය සිතුවමේ කොටසක්


දහසක් බුදුවරුන්ගේ රූප


අනෝතප්ත විල